# මයස්තීනියා (Myasthenia) රෝගය

Association of Sri Lankan Neurologists

## මයස්තීනියා රෝගය යනු කුමක්ද?

- මයස්තීනියා (Myasthenia) යනු ඔබේ ශරීරයේ ස්නායු සහ මාංශ පේශී අතර ආවේග සම්ප්‍රේෂණය අවහිර වීමෙන් ඇති වන තත්ත්වයකි. මේ සඳහා මූලිකව හේතු වන්නේ ප්‍රතිශක්තිකරණ පද්ධතියේ අසාමාන්‍ය අධි ක්‍රියාකාරිත්වයයි.

- මෙම තත්ත්වය හේතු කොටගෙන ඇස් වල, අත් පාද වල සහ බෙල්ලෙහි මාංශ පේශි මෙන්ම, හුස්ම ගැනීම සඳහා උපකාරී වන පේශිද දුර්වල විය හැක.

- දවස ගෙවී යන විට ක්‍රියාකාරී මාංශ පේශි ක්‍රමයෙන් දුර්වල වීමද, ශරීරයේ විඩාපත් බව වැඩි වීමද, මෙම රෝගයේ සුවිශේෂ ලක්ෂණ ලෙස දැක්විය හැක.

- මෙය නිදන්ගත රෝගී තත්ත්වයක් වන අතර, දිගු කාලීනව නීතිපතා ප්‍රතිකාර ගැනීම ඉතා වැදගත් වෙයි.

- මයස්තීනියා රෝගය බරපතල වන විට සමහර රෝගීන්ට හුස්ම ගැනීමෙහි සහ ගිලීමෙහි අපහසුතා ඇති විය හැකිය.

## ප්‍රතිකාර

- මෙම ඖෂධ ප්‍රතිකාර වල මූලික අරමුණ වන්නේ ස්නායු සහ මාංශ පේශි අතර ආවේග ගමන් කිරීම නිසි පරිදි පවත්වාගෙන යාමෙන් රෝග ලක්ෂණ පාලනය කිරීමයි.

- මේ සඳහා ඖෂධ කාණ්ඩ දෙකක් භාවිතා කරනු ලැබේ.
  එක් ඖෂධ කාණ්ඩයක් මගින් ස්නායු ආවේග ගමන් කිරීම සිදු කරන රසායනික ද්‍රව්‍ය වල මට්ටම ඉහල නංවයි. අනෙක් කාණ්ඩය මගින් අසාමාන්‍ය ලෙස අධි ක්‍රියාකාරිත්වයෙන් යුත් ප්‍රතිශක්තිකරණ පද්ධතිය පාලනය කරනු ලබයි. මෙම ඖෂධ කාණ්ඩය භාවිතයෙන් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම දිගු කාලීනව සිදු වන්නකි.

- ඔබේ රෝගය සඳහා සුදුසු ඖෂධ කාණ්ඩ ඔබේ වෛද්‍යවරයා නියම කරනු ඇත. වෛද්‍ය උපදෙස් නොමැතිව ඖෂධ නතර කිරීම හෝ මාත්‍රා වෙනස් කිරීම නොකල යුතු අතර, ජීවිත කාලය පුරාම උපදෙස් අනුව නියමිත ඖෂධ නිසි පරිදි ගැනීම ඉතා වැදගත් වේ.

- ප්‍රතිශක්තිකරණ පද්ධතිය පාලනය කරන ඖෂධ ගන්නා විට ඔබේ ශරීරයට විෂබීජ මගින් ඇතිවන ආසාදන අවධානම වැඩි වන හෙයින්, ඖෂධ ලබා ගන්නා අතරතුර ආසාදන වැළැක්වීම සඳහා ආරක්ෂිත පියවර ගැනීම ඉතාම වැදගත්ය.

- හදිසියෙහි ඖෂධ හිඟයක් ඇති වුවහොත්, නිසිපරිදි ප්‍රතිකාර නොලැබීමෙන් රෝගය බරපතල විය හැකි නිසා, අතිරික්ත ඖෂධ ප්‍රමාණයක් ඔබ ළඟ තබා ගැනීම විශේෂයෙන් වැදගත් වේ.

- මයස්තීනියා ඇති සමහර රෝගීන්ගේ පපුවෙහි පිහිටා ඇති තයිමස් ග්‍රන්ථියෙහි අසාමාන්‍ය වර්ධනයක් තිබිය හැක (thymoma). එවැනි තත්ත්වයක් හඳුනා ගෙන ප්‍රතිකාර කිරීම සඳහා ඔබේ වෛද්‍යවරයා පපුවේ ස්කෑන් පරීක්ෂණයක් කිරීමට ඉඩ ඇත.

Myasthenia Sinhala V1 - Copyright © Association of Sri Lankan Neurologists (2025)

## රෝගය උත්සන්න වීම වළක්වා ගැනීම

- මෙම රෝගය උත්සන්න වීමේ හේතු කාරක අතර ආසාදන, මානසික ආතතිය, ශල්‍යකර්මයන් පසුව ඇති වන ආතතිය, ඇතැම් ප්‍රතිජීවක ඖෂධ වර්ග, හෘද රෝග සහ රුධිර පීඩනය සඳහා නිර්දේශ කරන සමහර ඖෂධ, සඳහන් කල හැක.

- එබැවින්, මෙවැනි තත්ත්වයක් වළක්වා ගැනීම සඳහා, ඔබ වෙනත් රෝගයකට ප්‍රතිකාර ගන්න සෑම අවස්ථාවකදීම එම වෛද්‍යවරයාට මයස්තීනියා රෝගය සහ එහි ප්‍රතිකාර පිළිබඳව දැනුවත් කිරීම ඉතා වැදගත් වේ.

## මයස්තීනියා රෝගී තත්ත්වය උත්සන්න වීම හඳුනා ගන්නේ කෙසේද?

- පහත රෝග ලක්ෂණ ඇති වුවහොත් **ඉක්මනින්** ඔබේ වෛද්‍යවරයා හමු විය යුතුය -:

  - ඔබේ අත් සහ පාදවල දුර්වලතාවය සහ තෙහෙට්ටුව වැඩි වීම
  - කථනය දුර්වල වීම
  - හැපීමේ හෝ ගිලීමේ අපහසුතාව
  - බෙල්ලේ මාංශ පේශි වල දුර්වලතාවය නිසා හිස එසවීමට අපහසු වීම

- පහත සඳහන් රෝග ලක්ෂණ මතු වුවහොත් **වහාම** වෛද්‍ය ප්‍රතිකාර ලබා ගත යුතුය -:

  - හුස්ම ගැනීමේ අපහසුතාවයක් දැනීම
  - ඇඳේ හාන්සි වී සිටින විට හුස්ම ගැනීමට අපහසු වීම
  - හුස්ම ගැනීමේ වේගය වැඩි වීම
  - හුස්ම ගැනීම සඳහා නිරන්තරයෙන් කතාව නතර කිරීමට සිදු වීම
  - කැස්ස සිදු කිරීමේ ක්‍රියාවලිය අඩපන වීම
  - ගිලීමේ අපහසුතාව සහ මුඛයෙහි කෙල එකතු වීම
  - එක හුස්මට 1 සිට 20ට වඩා ගණන් කිරීමට නොහැකි වීම

## ගර්භනීභාවය සහ මයස්තීනියා රෝග තත්ත්වය

- කාන්තා රෝගීන් ඔවුන්ගේ ගැබ් ගැනීම කල් වේලා ඇතිව සැලසුම් කර, ඒ පිළිබඳව ඔවුන්ට ප්‍රතිකාර කරන වෛද්‍යවරුන් සමග සාකච්ඡා කිරීම වැදගත්ය.

- මෙහිදී ඔබගේත්, ඔබගේ දරුවාගේත් සෞඛ්‍ය සුරැකෙන පරිදි ප්‍රතිකාර සැලැස්මක් වෛද්‍යවරයා විසින් සූදානම් කරනු ලැබේ.

- ගර්භනී සමයේදී රෝගය හොඳින් පාලනය කල හැකි, අනතුරු දායක නොවන, ඖෂධ මෙහිදී වෛද්‍යවරයා විසින් නිර්දේශ කරනු ඇත.

- දරු ප්‍රසූතිය හා එය සිදු කරන ක්‍රම වේදයන් සම්බන්ධයෙන් ඔබගේ ප්‍රසව සහ ස්නායු විශේෂඥ වෛද්‍යවරුන් සමඟ සාකච්ඡා කර සැලසුමක් තීරණය කිරීම ඉතා වැදගත් වනු ඇත.

Myasthenia Sinhala V1 - Copyright © Association of Sri Lankan Neurologists (2025)